# පර්යේෂණ යෝජනා සම්පාදනය

# Research Proposal Writing

ශාස්ත්‍රවේදී (BA), විද්‍යාවේදී (BSc), ශාස්ත්‍රපති (MA), විද්‍යාපති (MSc), දර්ශනපති (MPhil), දර්ශනසූරි (PhD) යනාදි පර්යේෂණ උපාධි සඳහා ඉදිරිපත් වන විද්‍යාර්ථීන් බොහෝ විට ස්වකීය උපාධි පාඨමාලාවේ පාර්ශ්වීය අවශ්‍යතාවක් ලෙස සම්පූර්ණ කළ යුතු පර්යේෂණ උපාධි නිබන්ධයට පදනම් වන පර්යේෂණ කාර්ය පිළිබඳ පර්යේෂණ යෝජනාවක් (RP: research proposal) රචනා කොට ඉදිරිපත් කළ යුතුය. උසස් පර්යේෂණ උපාධි පිරිනැමෙනුයේ විද්‍යාර්ථීන් විසින් තෝරා ගනු ලැබූ අධ්‍යයන ක්ෂේත්‍රයක වර්තමානයේ පවත්නා ඥානයට ඔවුන්ගේ පර්යේෂණ කාර්ය මඟින් සිදු කෙරෙන සම්ප්‍රදානය කෙබඳුද යන්න සලකා බැලීමෙන් අනතුරුවය. පර්යේෂණ උපාධියක් ලබා ගැනීම යන්නෙන් අදහස් වන්නේ කිසියම් අධ්‍යයන ක්ෂේත්‍රයක පූර්වයෙහි පැවති ඥානයට උපාධිධරියෙකු විසින් යම් එකතු කිරීමක් කරන ලද බව තහවුරු වීමයි. එබැවින් පළමුවෙන්ම ඔබ එවැනි සම්ප්‍රදානයක් කිරීමේ හැකියාවෙන් යුක්ත බව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පිළිගත් සම්ප්‍රදායන්ට අනුකූලව පර්යේෂණ යෝජනාවක් සම්පාදනය කළ යුතු වෙයි. පර්යේෂණ යෝජනාවක පරමාර්ථය වන්නේ ඔබ සතු පර්යේෂණ සංකල්පය ඉදිරිපත් කිරීමත්, එහි යුක්ති සහගත භාවය පෙන්වා දීමත් මෙන්ම පර්යේෂණය මෙහෙයවිය යුතු ආකාරය පිළිබඳ ප්‍රායෝගික මාර්ගය විස්තර කිරීමත්ය. බොහෝ ශිෂ්‍යයෝ මෙන්ම ආරම්භක පර්යේෂකයෝද පර්යේෂණ යෝජනාවක් යනු කුමක්ද කියා අවබෝධ කොට නොගන්නා සේම එහි වටිනාකමද තේරුම් නොගනිති. අසාර්ථක යෝජනාවක් පර්යේෂණ නිබන්ධ උපදේශක කමිටුවකින් අනුමතිය ලද්දේ වුවද සාර්ථක පර්යේෂණ ව්‍යාපෘතියකට පදනම් කර ගත නොහැකි වනු ඇත. අනෙක් අතට පර්යේෂණ ව්‍යාපෘතියේ සාර්ථකත්වය පිළිබඳ සහතිකයක් දිය නොහැකි වුවත් සාර්ථක යෝජනාවක් මඟින් පර්යේෂකයෙකු ලෙස ඔබගේ හැකියාව පිළිබඳ ප්‍රබල ධාරණාවක් අන්‍යයන් තුළ ඇති කළ හැකිය.

පර්යේෂණ යෝජනාව මඟින් ප්‍රයෝජනවත් පර්යේෂණ ව්‍යාපෘතියක් ඔබට ඇති බවත්, එය සම්පූර්ණ කිරීමේ ශක්‍යතාව හා කාර්ය සැලසුමක් ඔබ සතු බවත් අන්‍යයන්ට ඒත්තු ගැන්විය යුතුය. සාමාන්‍යයෙන්, පර්යේෂණ යෝජනාවක් පර්යේෂණ ක්‍රියාවලියට අයත් සියලුම මූලිකාංග අන්තර්ගත කොට ගත යුතු වන අතර යෝජිත අධ්‍යයනය අගය කිරීමට ප්‍රමාණවත් තොරතුරුවලින්ද සමන්විත විය යුතුය.

ඔබගේ පර්යේෂණ ක්ෂේත්‍රය සහ ඔබ තෝරා ගත් ක්‍රමවේදය කුමක් වුවත්, ඕනෑම පර්යේෂණ යෝජනාවක් පහත සඳහන් ප්‍රධාන ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වේ:


Neranja Bandara
Senior Lecturer, Department of Sinhala and Mass Communication, USJ.

1. ඔබ කුමක් ඉටු කර ගැනීමට සැලසුම් කරන්නෙහිද ?

   What you plan to accomplish ?

2. ඔබට එය කිරීමට අවශ්‍ය ඇයි ?

   Why you want to do it ?

3. ඔබ එය කිරීමට බලාපොරොත්තු වන්නේ කවරාකාරයෙන්ද ?

   How you going to do it ?

ඔබ සතුව උත්තේජනකාරී පර්යේෂණ සංකල්පයක් ඇති බව මෙන්ම ප්‍රස්තුත සාහිත්‍යය, විෂයබද්ධ ප්‍රමුඛ වාදවිෂයන් (issues) සහ යෝග්‍ය ක්‍රමවේදයන් පිළිබඳ මනා අවබෝධයක් ඔබ සතු බව පාඨක ප්‍රජාවට ඒත්තු ගැන්විය යුතු වෙයි. වෙනත් ලෙසකින් කිව හොත් පර්යේෂණ යෝජනාවක අරමුණ වන්නේ ඔබගේ පර්යේෂණය කළ හැකි, උචිත සහ වැය වන කාලයට හා මුදලට සාපේක්ෂව ප්‍රයෝජනවත් පර්යේෂණ කාර්යයක් බව ඔබගේ ඉලක්ක සභාවට (උදා. පර්යේෂණ නිබන්ධ කමිටුව, අනුග්‍රාහක ආයතනය ආදි) ඒත්තු ගැන්වීමයි.

පර්යේෂණ යෝජනාවක් යනු මැනවින් විවරණිත **පර්යේෂණ ගැටලුවක්** සහ ඒ සඳහා සැලසුම් කළ බුද්ධිමත් හා ප්‍රායෝගික **විසර්ජන මූලෝපායක්** ඇති සංක්ෂිප්ත, පැහැදිලි **පර්යේෂණ අරමුණක්** සහිත සුනිර්වචිත ප්‍රකාශනයකි.

ඔබගේ පර්යේෂණ යෝජනාවෙහි ගුණාත්මක වටිනාකම පර්යේෂණ ව්‍යාපෘතියේ ගුණය මත පමණක් රඳා නොපවතින අතර එය යෝජනා රචනයේ ගුණාත්මක භාවය මතද රැඳේ. සාධනීය පර්යේෂණ ව්‍යාපෘතියක් පවා දුර්වල පර්යේෂණ යෝජනා රචනය හේතුවෙන් ප්‍රතික්ෂේප වීමේ අවදානමට මුහුණ දිය හැකිය. එබැවින් පර්යේෂණ යෝජනාවක රචනා විලාසය සංගත, පැහැදිලි හා අවධානය දිනා ගන්නාසුලු එකක් වීම අතිශයින් වැදගත් වේ.

**පර්යේෂණ යෝජනාවක මූලිකාංග**

1. මාතෘකාව (title)
2. සංක්ෂේපය (abstract)
3. හැඳින්වීම (introduction)
4. සාහිත්‍ය විමර්ශනය (literature review)
5. විධික්‍රම (methods)
6. සමාලෝචනය (conclusion)
7. ලේඛන නාමාවලිය (bibliography)

**මාතෘකාව**

පර්යේෂණයක මාතෘකාව සංක්ෂිප්ත මෙන්ම විග්‍රහාත්මක විය යුතුය. ඇතැම් පර්යේෂණ මාතෘකාවන්හි දකිය හැකි පාඨකයාගේ අවබෝධයට හේතු නොවන එමෙන්ම පර්යේෂණ කාර්යයේ ස්වභාවය පුනරුක්තියට නඟන ''. . . පිළිබඳ අධ්‍යයනයක්'', ''. . . පිළිබඳ ගවේෂණයක්'', ''. . . පර්යේෂණාත්මක අධ්‍යයනයක්'', ''. . . ඇතැම් ගැටලු පිළිබඳ පර්යේෂණයක්'' වැනි වාක්‍යාංශ බැහැර කිරීම සුදුසුය. බොහෝ මාතෘකා පර්යේෂණයේ කාර්යමය සම්බන්ධතාව අනුව ආරම්භ වනුයේ පැහැදිලි ලෙසම ඒවායේ ප්‍රාථමික විචල්‍යයන් (variables) සූචනය කිරීම මගිනි. කෙසේ වෙතත්, නිවේදනාත්මක මෙන්ම ආකර්ෂක මාතෘකාවක් නිර්මාණය කොට ගැනීම වැදගත් වෙයි. එලදායී මාතෘකාවක් පාඨකයාගේ රුචිය දල්වනු පමණක් නොව පාඨකයා අනුග්‍රාහකත්වයෙන් යුතුව යෝජනාව සලකා බැලීම සඳහා පූර්ව සූදානම් කරයි.

**සංක්ෂේපය**

මෙය ආසන්න වශයෙන් වචන 200-300ක පමණ සාරාංශයකි. සංක්ෂේපය කිසියම් පර්යේෂණ යෝජනාවක මූලික ලක්ෂණ පිළිබඳ අවබෝධයක් ලබා දෙන ක්ෂණික පරිදර්ශනයකි (quick overview). එය සමස්ත යෝජනාව පිළිබඳ පාඨකයාගේ ප්‍රථම හැඟීම කෙරෙහි ප්‍රබල ලෙස බලපායි. එබැවින් සංක්ෂේපය රචනා කිරීම කෙරෙහි වඩාත් සැලකිලිමත් වීම වැදගත්ය. එහි පර්යේෂණ ගැටලුව (research question), අධ්‍යයන සයුක්තීකරණය (rationale of the study), උපන්‍යාසය (hypothesis) (එවැන්නක් ඇත්නම්), ක්‍රමවේදය (methodology) සහ සොයාගැනීම්/නිගමන (findings) යන කරුණු පැහැදිලිව අන්තර්ගත විය යුතුය. ක්‍රමවේදය පිළිබඳ විශ්ලේෂණයන්හි සැලැස්ම (design), කාර්ය පටිපාටිය (procedure), නියැදිය (sample) සහ භාවිත කිරීමට බලාපොරොත්තු වන සියලු

පර්යේෂණ උපකරණ (research instruments) පිළිබඳ ප්‍රමාණවත් කරුණු කෙටියෙන් නමුත් පැහැදිලිව අඩංගු විය යුතුය. පර්යේෂණ යෝජනාවේ සෙසු කොටස් ලිවීමෙන් පසු මේ කොටස ලිවීම වඩාත් සුදුසුය.

## හැඳින්වීම

හැඳින්වීමෙහි ප්‍රධාන අරමුණ වන්නේ පර්යේෂණ ගැටලුවට අවශ්‍ය පසුබිම හෝ සන්දර්භය සම්පාදනය කිරීමයි. පර්යේෂණ ගැටලුව කවරාකාරයෙන් ආකෘතිගත කළ යුතුද යන්න ඇතැම් විට යෝජනා රචනයේදී මතු වන බරපතළම ප්‍රශ්නය විය හැකියි.

පර්යේෂණ ගැටලුව අනියමිත සාහිත්‍ය විමර්ශනයක් සමග අවිනිශ්චිත සන්දර්භයක ආකෘතිගත කළ හොත් සමස්ත පර්යේෂණය නොවැදගත් මෙන්ම රුචිකර නොවන ලෙස පෙනී යා හැකිය. එසේ නමුත්, එම ගැටලුවම අතිශය නිශ්චිත සන්දර්භයක සහ කාලීන පර්යේෂණ ක්ෂේත්‍රයක මැනවින් ස්ථානගත කළ හොත් එහි අර්ථාන්විත භාවය ප්‍රත්‍යක්ෂ වනු ඇත.

හැඳින්වීමක් ඔබගේ පර්යේෂණ යෝජනාව මඟින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන විෂය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රවේශයකින් පටන් ගැනීම සුදුසුය. පාඨකයා ඔබගේ පර්යේෂණ ක්ෂේත්‍රය පිළිබඳ හුරුපුරුදු හා මනා දැනුමකින් යුක්ත වන බව පූර්ව නිගමනය නොකළ යුතුය. හැඳින්වීම මඟින් ඔබගේ විෂය ක්ෂේත්‍රයට පිවිසෙන ආධුනිකයෙකුට පවා වැටහෙන පරිදි ඔබගේ අධ්‍යයනයේ ස්වභාවය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ලබා දීම වැදගත්ය.

ආකර්ශනීය මෙන්ම නිවේදනාත්මක ආරම්භක ඡේදයක් රචනා කරන්නේ කෙසේද යන්නට නිර්දේශයක් නොමැති ලෙසම පර්යේෂණ ගැටලුවක් නිර්මාණය කර ගැනීමට පිළිපැදිය යුතු නියමිත නීති මාලාවක්ද නොමැත. එය ඔබගේ නිර්මාණශීලීත්වය, නිරවුල්ව සිතීමේ හැකියාව සහ ගැටලුව හා බැඳුණු ක්ෂේත්‍රය පිළිබඳ ඔබගේ අවබෝධයේ ගැඹුරු බව යනාදිය මත රඳා පවතී.

කෙසේ වෙතත්, ඔබගේ පර්යේෂණ ගැටලුව කාලීන ''උණුසුම්'' ක්ෂේත්‍රයක හෝ ජීවමය භාවය තවදුරටත් රැඳී ඇති පැරණි ක්ෂේත්‍රයක ස්ථානගත කිරීමට උත්සාහ ගැනීම ඵලදායකය. දෙවනුව, ඒ උදෙසා කෙටි එහෙත් ප්‍රමාණවත් ඓතිහාසික පසුබිමක් සම්පාදනය කිරීමද අවශ්‍යය. තෙවනුව, යෝජිත පර්යේෂණ ගැටලුව කේන්ද්‍රගත වන සමකාලීන සන්දර්භයක් නිර්මාණය කළ යුතුය. අවසාන වශයෙන්, ඔබගේ පර්යේෂණ ගැටලුවෙහි මුඛ්‍ය සංරචකවල (key components) සුවිශේෂත්වය ප්‍රකට වන පරිදි එයට පෘථුල අර්ථ කථනයක් ලබා දීමද වැදගත්ය.

ඔබගේ ව්‍යාපෘතිය පර්යේෂණ කාර්යයේ යෙදවීමට තරම් වටිනාකමකින් යුක්ත වූවක් බව යෝජනාව මගින් ඔප්පු කළ යුතුය. සෙසු සියලු පර්යේෂණවලින් මෙන්ම ඔබගේ පර්යේෂණයෙන්ද පවත්නා දැනුම දියුණු කෙරෙන බව සැබෑවකි. එහෙත්, එම දැනුම සියල්ලන්ටම අවශ්‍යද? යන ප්‍රශ්නය නැඟිය යුතුය. එබැවින් ස්වකීය පර්යේෂණයට අදාළ සුවිශේෂ වටිනාකම ඒත්තු ගැන්විය හැකි තර්කණයක් ගොඩ නැඟීම අතිශයින් වැදගත්ය. ප්‍රායෝගික භාවිතය, අදාළ ක්ෂේත්‍රයෙහි නැතහොත් ඊට බලපාන වෙනත් ක්ෂේත්‍රවල ඥාන සංවර්ධනය වේගවත් කිරීමට හේතු වීම, නව පර්යේෂණ විභවයන් විවෘත කිරීම වැනි දෑ එහි වැදගත් සංරචක විය හැකිය. කෙසේ වෙතත්, ඔබගේ පර්යේෂණ ගැටලුව සුවිශේෂත්වයට පැමිණෙන ආකාරයත්, ඊට සම්බන්ධිත අනෙකුත් ශික්ෂණයන් පිළිබඳවත් මෙහිදී ප්‍රමාණවත් විවරණයක් කළ යුතුය. ඔබ විසින් තෝරා ගත් අධ්‍යයන ක්ෂේත්‍රය මෙන්ම ඔබගේ පර්යේෂණ ගැටලුව අන්‍යයන්ගේ අවධානයට මෙතුවක් ලක් නොවුණේ මන්ද යන්නත්, ඔබ එය තෝරා ගැනීමට බලපෑ සියලු හේතුත් පැහැදිලිව දැක්වීම අවශ්‍යය.

හැඳින්වීමක් නියම වශයෙන් සුවිශේෂ පර්යේෂණ ගැටලුව කෙරෙහි කේන්ද්‍රගත වූ අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳ සාමාන්‍ය ප්‍රකාශයකින් ආරම්භ කළ යුතුය. එසේම යෝජිත අධ්‍යයනය සාධාරණීකරණය කිරීමේ නැතහොත් එහි තර්කානුකූලත්වය පෙන්වා දීමේ අරමුණ සැමවිටම අවධාරණය විය යුතුය.

සාර්ථක හැඳින්වීමක් සාමාන්‍යයෙන් පහත දැක්වෙන ලක්ෂණවලින් යුක්ත වේ:

01. පර්යේෂණයේ අරමුණ පැහැදිලිව ප්‍රකාශ වන පරිදි පර්යේෂණ ගැටලුව ඉදිරිපත් කිරීම.

02. පර්යේෂණයේ අවශ්‍යතාව හා වටිනාකම ප්‍රත්‍යක්ෂ වන ආකාරයෙන් පර්යේෂණ ගැටලුව සඳහා සන්දර්භයක් සහ වේදිකාවක් සම්පාදනය කිරීම.

03. යෝජිත අධ්‍යයනයේ තර්කානුකූලත්වය පැහැදිලි කිරීම සහ එය සිදු කිරීමේ වැදගත්කම පැහැදිලිව පෙන්වා දීම.

04. පර්යේෂණයට බල පෑ හැකි ප්‍රමුඛ වාදවිෂයන් සහ අතුරු ප්‍රශ්න කෙටියෙන් විස්තර කිරීම.

05. පර්යේෂණයේ මූලික විචල්‍යයන් හඳුනාගැනීම. එසේ නැතහොත්, ඔබට අධ්‍යයනය කිරීමට අවශ්‍ය ප්‍රපංචය නියම වශයෙන් සඳහන් කිරීම.

06. උපකල්පනයක් හෝ න්‍යායක් ඇත්නම් සඳහන් කිරීම.
(ඔබගේ පර්යේෂණය ගවේෂණාත්මක (exploratory) හෝ ප්‍රපංචවේදී (phenomenological) අධ්‍යයනයක් නම් එහි උපකල්පන නොමැති විය හැකිය.)

07. යෝජිත පර්යේෂණය පැහැදිලිව කේන්ද්‍රගත වී පෙනෙන පරිදි එහි සීමා නිර්ණය පැහැදිලිව සඳහන් කිරීම.

08. මුඛ්‍ය සංකල්ප සඳහා අර්ථ කථන සැපයීම.
(යෝජනාවලි රචනයේදී කිසිවිටෙකත් බහුඅර්ථතාව හෝ අර්ථ ව්‍යාකූලත්වය සහිත භාෂා ව්‍යවහාරයක් භාවිත නොකළ යුතු අතර හැඳින්වීම තුළ පර්යේෂණයේ මූලික සංකල්ප මැනවින් හා නිශ්චිත ලෙස අර්ථ දක්වා තිබිය යුතුය. ඒ සඳහා භාවිත කොට ඇති වචන හා යෙදුම්වල සම්මත අර්ථ පැහැදිලි කොට තිබීම මෙන්ම අර්ථමය ව්‍යාකූලත්වයක් සහිත වචන හෝ යෙදුම් ඇතොත් පර්යේෂණය තුළ ඒවා භාවිත කරන්නේ කවර අර්ථයෙන්ද යන්න ඉතා පැහැදිලි හා නිශ්චිත ලෙස අර්ථකථනය කොට තිබීම අත්‍යවශ්‍යය. ඒ සඳහා පිළිගත් ශබ්ද කෝෂ, විශ්වකෝෂ යනාදියෙන් අරුත් උපුටා දැක්වීම සුදුසුය.)

**සාහිත්‍ය විමර්ශනය**

ඇතැම් විට සාහිත්‍ය විමර්ශනය හැඳින්වීමේ කොටසටද අන්තර්ගත විය හැකිය. කෙසේ වෙතත්, පරිපූර්ණ සාහිත්‍ය විමර්ශනයකට ඉඩ සලසීම සඳහා සාහිත්‍ය විමර්ශනය වෙනම කොටසක් ලෙස දැක්වීම වඩාත් සුදුසුය. සාහිත්‍ය විමර්ශනය අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳ ඔබගේ න්‍යායික දැනුම පාඨකයන්ට ප්‍රත්‍යක්ෂ කරවීමට මෙන්ම පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා න්‍යායික පදනමක් ගොඩනගා ගැනීමටද යොදා ගත හැකිය. අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ සියලුම ලිපි හා ග්‍රන්ථ ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලියෙහි සඳහන් කළද ඒ සියල්ල මෙහිදී විමර්ශනය කළ යුතු නොවෙයි. ඔබගේ පර්යේෂණයට ඍජුව සම්බන්ධ වන කෘති කෙරෙහි පමණක් අවධානය කේන්ද්‍ර කොට ගැනීමට උත්සාහ ගත යුතුය.

සාහිත්‍ය විමර්ශනය රචනා කිරීමේදී ඔබගේ අරමුණ විය යුත්තේ තම අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළව මේ වන තෙක් පැවති ස්ථාපිත ඥානය එහි ප්‍රබලතා සහ දුර්වලතාද සමඟින් පාඨකයා වෙත ගෙන ඒමයි. සාහිත්‍ය විමර්ශනය මඟින් උපදේශාත්මක සංකල්පයකින් යුක්තව නිශ්චිත විවරණයක් කළ යුතු වෙයි. එය පවත්නා කෘති ලැයිස්තුව පිළිබඳ හුදු විස්තරයක් හෝ ඒවා පිළිබඳ සාරාංශවල එකතුවක් නොවිය යුතුය. සාර්ථක සාහිත්‍ය විමර්ශනයක් කිරීමට දෙආකාරයක හැකියාවන් ඔබට තිබිය යුතුය:

I. තොරතුරු අන්වේෂණය: සාහිත්‍යය කාර්යක්ෂමව සුපරීක්ෂා කොට ඵලදායී කෘති සොයා ගැනීමට ඇති හැකියාව.

II. විවේචනාත්මක අර්ඝනය: අපක්ෂපාතී හා වටිනා අධ්‍යයන හඳුනා ගැනීමට විවේචනාත්මක මූලධර්ම භාවිත කිරීමට ඇති හැකියාව.

සාහිත්‍ය විමර්ශනය මඟින් වැදගත් කාර්ය කිහිපයක් ඉටු වේ.

01. ඔබගේ පර්යේෂණය මඟින් මැනවින් විවරණිත ක්ෂේත්‍රයක් නැවත පිරික්සීම නොකෙරෙන බව නිශ්චිත ලෙස දැනගැනීම.

02. ඔබගේ පර්යේෂණය සඳහා පදනම සැකසූ පූර්වගාමීන් හඳුනා ගැනීම.

03. පර්යේෂණ ගැටලුව පිළිබඳ ඔබගේ දැනුම ප්‍රදර්ශනය කිරීම.

04. පර්යේෂණ ගැටලුවට අදාළ න්‍යායික හා පර්යේෂණාත්මක වාදවිෂයන් පිළිබඳ ඔබගේ අවබෝධය ප්‍රදර්ශනය කිරීම.

05. අදාළ සාහිත්‍යික තොරතුරු විචාර පූර්වකව අර්ඝනය කිරීමෙහි ලා ඔබගේ හැකියාව පෙන්වා දීම.

06. පවත්නා සාහිත්‍යය සමෝධානය කිරීමට සහ සංස්ලේෂණය කිරීමට ඇති හැකියාව පෙන්වා දීම.

07. පර්යේෂණය සඳහා නව න්‍යායික අන්තර්දෘෂ්ටීන් හෝ නව හැඩයන් සහිත සාංකල්පික රාමුවක් සම්පාදනය කිරීම.

08. ඔබගේ යෝජිත පර්යේෂණය පවත්නා සාහිත්‍යයට වැදගත් හා සාර්ථක සම්ප්‍රදානයක් සිදු කරන බවට පාඨකයා ඒත්තු ගැන්වීම. (උදා: වැදගත් න්‍යායික වාදවිෂයක් නිශ්චය කර ගැනීම මඟින් හෝ සාහිත්‍යයේ ප්‍රමුඛ හැදෑසක් පිරවීම මඟින්)

බොහෝ විද්‍යාර්ථීන්ගේ සාහිත්‍ය විමර්ශන පහත දැක්වෙන ගැටලුවලින් පෙළෙයි:

- සංවිධානාත්මක භාවයේ හා ව්‍යූහයේ දුර්වලතා
- ඒකාග්‍රතාව හා ගැළපීම කෙරෙහි දක්වන අඩු අවධානය
- පුනරුක්තිය හා වාග්බාහුල්‍යය
- වැදගත් ලේඛන සඳහන් කිරීමට නොහැකි වීම
- ආශ්‍රිත ලේඛන විචාරාත්මකව අර්ඝනය කිරීමට නොහැකි වීම
- අනදාළ හෝ නොවැදගත් සැඳහුම් සහිත වීම
- ප්‍රමාණය ඉක්මවා ද්විතීයක මූලාශ්‍රය මත රඳා පැවතීම

ඉහත ලක්ෂණවලින් කිසිවක් ඔබගේ පර්යේෂණ යෝජනාවෙහි අඩංගු වන්නේ නම් එය ඔබගේ විෂය ඥානය හා පර්යේෂණ ශක්‍යතාව ප්‍රශ්න කරන්නක් වනු ඇත.

ඔබගේ සාහිත්‍ය විමර්ශනය සංවිධානය කිරීමේ ආකාර කිහිපයක් වෙයි. මූලික වශයෙන් එකී විමර්ශනය අනුමාතෘකාවලට වෙන් කොට පෙළ ගැස්වීම එහි සංගත භාවයට හේතු වනු ඇත. ඔබගේ පර්යේෂණ ක්ෂේත්‍රයේ වැදගත්කම, ස්ථාවරත්වය හා වර්තමාන සංවර්ධනය පෙන්වා දීමට එම ක්ෂේත්‍රයේ න්‍යායික හැඩතල, මැනීම් උපකරණ, අන්තර් සංස්කෘතික සහ ස්ත්‍රී-පුරුෂ විශේෂතා වැනි අදාළ උපක්ෂේත්‍ර හෝ වාදවිෂයන් සඳහා සාහිත්‍ය විමර්ශනය තුළ විවිධ අනුකොටස්වලට වෙන් කිරීම සුදුසුය.

ඔබ කිසියම් පාඨක ප්‍රජාවකට කථාන්තරයක් කියන බව සිත්හි තබා ගැනීම පර්යේෂණ යෝජනාව සකස් කිරීමේදී අතිශය ප්‍රයෝජනවත් වේ. ඔබගේ කථාන්තරය උත්තේජනකාරී හා සිත් ඇදගන්නා විලාසයෙන් ඉදිරිපත් කිරීමට උත්සාහ දැරීම එහි සාර්ථකත්වයට හේතු වනු ඇත. පාඨක සිත් තුළ කරදරකාරී ව්‍යාකූල හැඟීමක් ඇති කිරීම ඔබගේ වටිනා පර්යේෂණ යෝජනාව ප්‍රතික්ෂේප වීමට මඟ පෑදීමක් විය හැකිය.

සාහිත්‍ය විමර්ශනය ආනුක්‍රමිකව පෙළ ගස්වන ලද කෘති මාලාවක් පිළිබඳ විස්තරයක් හෝ එක් එක් කෘතිය පිළිබඳ ආනුක්‍රමික සාරාංශයක් ලෙස ඉදිරිපත් කිරීම නොකළ යුතුය. ඔබගේ පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ වැදගත් සාහිත්‍ය කෘති සියල්ල පිළිබඳ සංස්ලේෂණයක් සාහිත්‍ය විමර්ශනයෙන් ඉදිරිපත් වීම මෙන්ම යම් විවේචනාත්මක අගය කිරීමක්ද එයින් සිදු විය යුතුය.

**විධික්‍රම**

විධික්‍රමය විස්තර කෙරෙන කොටස අතිශය වැදගත් වන්නේ එමඟින් ඔබ පර්යේෂණ ගැටලුව නිරාකරණය කර ගැනීමට බලාපොරොත්තු වන්නේ කෙසේද යන්න පාඨක ප්‍රජාවට පැහැදිලි කර දෙන බැවිනි. එම කොටසින් ඔබගේ කාර්ය සැලැස්මද, ඔබගේ පර්යේෂණ ව්‍යාපෘතිය සම්පූර්ණ කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම්ද විස්තර කෙරෙයි.

විධික්‍රම කොටස රචනා කිරීමේදී අනුගමනය කළ යුතු ප්‍රධාන උපදේශක මූලධර්මය නම් පාඨකයාට පර්යේෂකයාගේ ක්‍රමවේදය පරිපූර්ණ වූවක්ද යන්න නිර්ණය කිරීමට ප්‍රමාණවත් තොරතුරු එහි අඩංගු කළ යුතු වීමයි. සාර්ථක පර්යේෂණ යෝජනාවක් වෙනත් සුදුසුකම් ලත් පර්යේෂකයෙකුට පවා ක්‍රියාවේ යෙදවීමට හැකි වන අයුරින් ප්‍රමාණවත් තොරතුරු අඩංගු කර ගත්තක් විය යුතුය. එහිදී විධික්‍රම කොටසේ විස්තරාත්මක පැහැදිලි කිරීම බෙහෙවින් වැදගත් වෙයි.

එමෙන්ම විකල්ප ක්‍රමවේදයන් පිළිබඳ ඔබගේ දැනුමද මෙහිදී ප්‍රදර්ශනය කළ යුතු අතර ඔබ තොරා ගත් ප්‍රවේශය අදාළ පර්යේෂණ ගැටලුව අධ්‍යයනය කිරීම සඳහා භාවිත කළ හැකි අතිශය යෝග්‍යතම හා සප්‍රමාණ මාර්ගය බව පෙන්වා දීමද කළ යුතුය.

ශාස්ත්‍රීය පර්යේෂණ ඒවායේ භාවිත විධික්‍රමයට අනුව ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැකිය.

I ප්‍රමාණාත්මක පර්යේෂණ (quantitative research)

II ගුණාත්මක පර්යේෂණ (qualitative research)

ප්‍රමාණාත්මක පර්යේෂණ මූලික වශයෙන් සංඛ්‍යා දත්තවල ප්‍රමාණාත්මක අගයන් මත පදනම් වේ. ප්‍රමාණීකරණය සඳහා සංඛ්‍යානමය ඇගයුම් කාර්ය පටිපාටිය භාවිත කරයි. උපන්‍යාස නිර්මාණය, පුරෝකථනය හා නිගමන සාධාරණීකරණය එකී ඇගයුම් ක්‍රම පදනම් කොට ගෙන සිදු කෙරෙයි. ප්‍රමාණාත්මක පර්යේෂණයකදී දත්තවල සංඛ්‍යාත්මක නිරවද්‍යතාව මෙන්ම ඒ සඳහා භාවිත කෙරෙන පර්යේෂණ උපකරණයද අතිශය වැදගත් සාධක වේ. මෙහිදී මූලික අවධානය යොමු කෙරෙනුයේ වාස්තවික ප්‍රමාණකරණයන් හා සංඛ්‍යානමය විශ්ලේෂණයන්ටය. එබැවින් මෙම පර්යේෂණ සඳහා පරිගණක දත්ත විශ්ලේෂණ උපකරණ භාවිතය වඩාත් පහසුවේ.

මානව ශාස්ත්‍ර හෝ සමාජීය විද්‍යා විෂයක පර්යේෂණවල නිරත වන ඔබ බොහෝ විට ගුණාත්මක පර්යේෂණයකට යොමු විය හැකිය. ගුණාත්මක පර්යේෂණයක විධික්‍රමය විස්තර කිරීම ප්‍රමාණාත්මක පර්යේෂණයකට සාපේක්ෂව වඩාත් අසීරු කාර්යයකි. ගුණාත්මක විශ්ලේෂණය පිළිබඳ සුප්‍රතිෂ්ඨාපිත හා පොදුවේ පිළගත් විධිනියමයක් නැත. එබැවින් ගුණාත්මක විධික්‍රමය තෝරා ගන්නා ඔබ විසින් සාම්ප්‍රදායික ප්‍රමාණාත්මක විධික්‍රමයට වඩා බොහෝ සෙයින් වැඩි විස්තර විභාග ඉදිරිපත් කළ යුතු වේ. ප්‍රමාණාත්මක පර්යේෂණයකට සාපේක්ෂව ගුණාත්මක පර්යේෂණයක දත්ත ඒකරාශිකරණ ක්‍රියාවලිය එහි ප්‍රතිඵල කෙරෙහි වඩාත් වැඩි බලපෑමක් ඇති කරයි. එබැවින් ඔබ දත්ත ඒකරාශිකරණය හා විශ්ලේෂණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය.

ගුණාත්මක පර්යේෂණය ප්‍රවේශයක් වශයෙන් වඩාත් පෘථුල හා ස්වාභාවික වෙයි. එමගින් මානව සමාජ යථාර්ථය නිරීක්ෂණය කිරීම හා අර්ථකථනය කිරීම සිදු වෙයි. කිසියම් සමාජ කණ්ඩායමක සංස්කෘතිය හෝ විශේෂ හැසිරීම් රටා පිළිබඳ අධ්‍යයනය කිරීමට ගුණාත්මක පර්යේෂණය භාවිත කරන්නෙකු හුදු ප්‍රමාණාත්මක මැනීමකට වඩා පෘථුල වූ මානව අන්තර් සම්බන්ධතා පිළිබඳ ප්‍රාථමික තත්වයන් ගැඹුරින් විමසා බලා විශ්ලේෂණය කිරීමේ හැකියාව ලබා ගනී. ප්‍රමාණාත්මකව ගණනය කළ නොහැකි ප්‍රපංච, ක්‍රියාවලි, සහ අර්ථවල ගුණයන් ගුණාතමක පර්යේෂණ මගින් අධ්‍යයනයට භාජන කෙරේ. සාමාජිකව ගොඩනැගුණු සංසිද්ධි පිළිබඳ යථාර්ථය ගුණාත්මක පර්යේෂකයන්ගේ අවධානය දිනා ගනී. ගුණාත්මක පර්යේෂණය සමාජ ජීවිතය එහි ස්වාභාවික පසුබිමෙහි පිහිටුවා විභාග කරයි.

ගුණාත්මක පර්යේෂණ සාමාන්‍යයෙන් පහත දැක්වෙන දෑ කෙරෙහි අවධානය යොමු කරයිඃ

- අර්ථ නිරූපණ = (සංස්කෘතිය, භාෂාව, ධර්මතා)
- පිළිවෙත් = (ආචරණ විධි)
- සිද්ධි = (දික්කසාද, සාපරාධී ක්‍රියා)
- අන්තර් ක්‍රියා = (ද්විපුද්ගල සම්න්ධතා, අන්තර් සංස්කෘතික සම්බන්ධතා)
- භූමිකා = (දෘෂ්ටිවාදාත්මක ආස්ථාන, ජනවාර්ගික කණ්ඩායම්)
- අන්‍යෝන්‍ය සම්බන්ධතා = (පෞද්ගලික හා සාමාජික අන්තර් සම්න්ධතා)

ගුණාත්මක පර්යේෂණවල  දැකිය හැකි පොදු ලක්ෂණ කිහිපයක් ඇත.

- සාමාජික ලෝකය පිළිබඳ අර්ථකථනය, අවබෝධය හා ඒවාට පදනම් වූ මානව සම්බන්ධතා විමසීම පිළිබඳ පෘථුල හා දාර්ශනික ආස්ථානයක් ගැනීම.
- දත්ත නිපදවුණු සාමාජික සන්දර්භය කෙරෙහි සංවේදී වූ හා නම්‍යශීලී වූ දත්ත රාශිකරණ ක්‍රම මත පදනම් වීම.
- සම්පරීක්ෂණ නියමයන්ට වඩා දෛනික සන්දර්භයන් භාවිත කිරීම.
- ව්‍යූහගත නොවූ දත්ත සමුච්චයන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වීම. (පූර්ව උපන්‍යාස සහ පූර්ව නිර්වචන නොමැති වීම.)
- සමාජ ජීවිතයේ ක්ෂුද්‍ර අංශ කෙරෙහි සැලකිලිමත් වීම.
- සාමාජික අන්තර් ක්‍රියාවන්ගේ අර්ථ හා ක්‍රියාකාරිත්වයන් පිළිබඳ සැලකිලිමත් වීම.
- ප්‍රමාණීකරණය අප්‍රධාන වීම.
- උපන්‍යාස පරීක්ෂණය වෙනුවට උද්ගාමී (inductivist) ක්‍රමවේදය භාවිත කිරීම.

**සමාලෝචනය**

ඉතා පැහැදිලි ලෙසම පර්යේෂණ යෝජනා අදියරේදී ඔබ සතුව පර්යේෂණ ප්‍රතිඵල තිබිය නොහැකිය. කෙසේ වෙතත්, ඔබ ඒකරාශි කිරීමට බලාපොරොත්තු වන්නේ කවර වර්ගයේ දත්තද, පර්යේෂණ ගැටලුවට නැතහොත් උපන්‍යාසයට පිළිතුරු සැපයීම සඳහා භාවිත කිරීමට අපේක්ෂා කරනුයේ කවර ක්‍රියා පටිපාටියක්ද යන කරුණු පිළිබඳ ඔබ සතුව යම් අදහසක් තිබීම අවශ්‍යය.

ඔබගේ යෝජිත පර්යේෂණය මඟින් විය හැකි බලපෑම පිළිබඳ පාඨකයා ඒත්තු ගැන්වීම වඩා වැදගත් වෙයි. අතිශයෝක්තියෙන් තොර, උද්යෝගිමත් හැඟීමෙන් හා විශ්වසනීයත්වයෙන් යුක්තව ඔබගේ යෝජනාවේ කුශලතා පැහැදිලිව හා විවෘතව ඉදිරිපත් කළ යුතු වේ. එසේම, යෝජිත පර්යේෂණයේ සීමා හා දුර්වලතාද සඳහන් කිරීම වැදගත් වන්නේ එමගින් ඔබගේ

පර්යේෂණයේ මුල් අදියරවලදී මතු විය හැකි කාලමය සහ මූල්‍යමය සංරෝධක පිළිබඳ යම් ප්‍රමාණකරණයක් සිදු කළ හැකි බැවිනි.

මේ සියල්ල පැහැදිලි ලෙස සමාලෝචනයේ අන්තර්ගත වීම අවශ්‍යය. ඔබගේ පර්යේෂණ ගැටලුවට විසඳුම් සම්පාදනය කිරීමට ඔබගේ පර්යේෂණ ව්‍යාපෘතියට ඇති හැකියාව සමස්තයක් ලෙස පර්යේෂණ යෝජනාව තුළින් මතු විය යුතු අතරම සමාලෝචනයෙන්ද එය සුපැහැදිලි ලෙස අවධාරණය විය යුතුය. එම කාර්ය සිදු වෙයි නම් එහි අදහස ඔබ සතුව මැනවින් රචිත, සාර්ථක පර්යේෂණ යෝජනාවක් තිබෙන බවයි.

## ලේඛන නාමාවලිය

පර්යේෂණයට අදාළ සමස්ත සාහිත්‍යය, මූලාශ්‍රය දැක්වමේ සම්මත ශෛලියකට (citation style) අනුව පර්යේෂණ යෝජනාව අවසානයේ දැක්විය යුතුය. එයට ග්‍රන්ථ, කෝෂ ග්‍රන්ථ, ලිපි යනාදිය මෙන්ම සංගත තැටි (CDs, DVDs), දත්ත සංහිතා (data bases) සහ අන්තර්ජාලීය ප්‍රකාශන වැනි විද්‍යුත් මූලාශ්‍රයද ඇතුළත් කළ හැකිය. ලේඛන නාමාවලිය මඟින් පර්යේෂණයට අදාළ ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රයවලින් යුක්ත සමස්ත සාහිත්‍යය පිළිබඳ ඔබගේ අවබෝධය මෙන්ම තොරතුරු ගවේෂණ හැකියාව ප්‍රකාශයට පත් වෙයි. එමෙන්ම මූලාශ්‍රය දැක්වීමේ ශෛලීන් හා ආචාරධර්ම පිළිබඳ අවබෝධයද එයින් පළ වන හෙයින් ඒ පිළිබඳ සැලකිලිමත් වීම වැදගත්ය.

ඔබට මෙම කාර්යය සඳහා මූලාශ්‍රය දැක්වීමේ පරිගණක මෘදුකාංගවල මෙන්ම අන්තර්ජාලයීය මූලාශ්‍රය ජනනය කිරීමේ සේවාවන්ගේද (online citation generators) සහාය ලබා ගත හැකිය.

## පර්යේෂණ යෝජනාවලි රචනයේ පොදු දුර්වලතා

01. පර්යේෂණ ගැටලුව සැලසුම්ගත කිරීම සඳහා යෝග්‍ය සන්දර්භයක් සම්පාදනය කිරීමේ නොහැකියාව.

02. පර්යේෂණයේ පරිස්ථිතික තත්වයන් (limitations) මැනවින් සීමා කර ගැනීමට අපොහොසත් වීම.

03. පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ ප්‍රමුඛ අධ්‍යයන පිළිබඳ සඳහන් නොවීම.

04. වෙනත් පර්යේෂකයන්ගේ න්‍යායික (theoretical) හා ආනුභූතික (empirical) සම්ප්‍රදායන් නිවැරදිව ග්‍රහණය කර ගැනීමේ හා විවේචනාත්මකව අගය කොට ඉදිරිපත් කිරීමේ නොහැකියාව.

05. පර්යේෂණ ගැටලුව කෙරේ අවධානය කේන්ද්‍රගත කර ගැනීමේ නොහැකියාව.

06. යෝජිත පර්යේෂණය පිළිබඳ සංගත හා චිත්තාකර්ෂක තර්කණයක් ගොඩ නඟා ගැනීමට අසමත් වීම.

07. අප්‍රධාන වාදවිෂයන් පිළිබඳ අධිකව කරුණු ඉදිරිපත් කරන නමුත් ප්‍රධාන වාදවිෂය පිළිබඳ ප්‍රමාණවත් ලෙස කරුණු ඉදිරිපත් නොවීම.

08. අනවශ්‍ය විස්තරවලින් යුක්ත වීම; නියමිත දිශාව පිළිබඳ හැඟීමකින් තොරව ''සමස්ත සැලැස්ම පුරා'' ගමන් කිරීම. (ප්‍රශස්ත යෝජනාවලිය බාධා රහිත ගංගාවක් මෙන් පහසුවෙන් හා ශෝභනව ඉදිරියට ගලා යයි.)

09. මූලාශ්‍රය දැක්වීමේ දෝෂ අධික වීම සහ සාවද්‍ය මූලාශ්‍රය භාවිතය.

10. ප්‍රමාණයට වඩා දීර්ඝ වීම හෝ ප්‍රමාණයට වඩා කෙටි වීම.

11. ආධුනික හා බොළඳ රචනා විලාසය.

## ආශ්‍රේය මූලාශ්‍රය

Libguides.usc.edu. 2020. *Research Guides*. [online] Available at: <https://libguides.usc.edu/?b=s> [Accessed 21 April 2020].

Research.umich.edu. 2020. *The Proposal Writer's Guide: Overview* | *ORSP*. [online] Available at: <http://www.research.umich.edu/proposals/pwg/pwgcontents.html> [Accessed 21 April 2020].

Wong, P., 2020. *How To Write A Research Proposal* | *Dr. Paul Wong*. [online] Drpaulwong.com. Available at: <http://www.drpaulwong.com/how-to-write-a-research-proposal/> [Accessed 21 April 2020].